# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය
## (ඉවත් කිරීම)

**2002 අංක 22 දරන පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය පනත ඉවත් කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

ගරු අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා විසින්
2013 ජුනි මස 04 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 මැයි මස 13 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

**[242 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 3.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

2—PL 007298—1,000 (2013/06)

## පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය (ඉවත් කිරීමේ)

එල්. ඩී.—ඕ. 3/2012.

**2002 අංක 22 දරන පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය පනත ඉවත් කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය.*

**1.** මේ පනත 2013 අංක දරන පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය (ඉවත් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*2002 අංක 22 දරන පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය පනත ඉවත් කිරීම.*

**2.** 2002 අංක 22 දරන පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

*පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය අරමුදලේ පැවැති මුදල් ආදිය ඒකාබද්ධ අරමුදලට මාරු කරනු ලැබිය යුතු බව.*

**3.** (1) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය අරමුදලේ බැරට පවතින්නා වූ සියලු මුදල් මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට බලපැවැත්වෙන පරිදි ඒකාබද්ධ අරමුදලට මාරු විය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පවත්නා වූ පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය වෙත පවරා ඇති හෝ ඒ මණ්ඩලය විසින් මිලදී ගෙන ඇති හෝ අත්කරගෙන ඇති හෝ ඒ මණ්ඩලයට බදු දී ඇති හෝ ඒ මණ්ඩලය විසින් බැහැර කරනු ලැබිය හැකි හෝ ඒ මණ්ඩලයේ සන්තකය යටතේ හෝ පාලනය යටතේ පැවති යම් චංචල හෝ නිශ්චල දේපලක්, ඒ දේපලට සම්බන්ධ යම් නියම හා කොන්දේසිවලට යටත්ව, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට බලපැවැත්වෙන පරිදි, පාර්ලිමේන්තුව වෙත පවරා දී ඇති හෝ පාර්ලිමේන්තුව විසින් මිලදී ගෙන හෝ අත්කරගෙන ඇති හෝ පාර්ලිමේන්තුවට බදු දී ඇති හෝ පාර්ලිමේන්තුව විසින් බැහැර කරනු ලැබිය හැකි හෝ පාර්ලිමේන්තුවේ සන්තකය හෝ පාලනය යටතේ පවතින්නා වූ දේපලක් ලෙස සලකනු ලැබිය යුතු ය.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

**4.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

2—PL 007161—450 (2013/04)

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.